# නවයුගය ඔබේ දත්ත ප්‍රවාහයේ වේගය ?

ඔබගේ පරිගණකයට අන්තර්ජාලයෙන් තොරතුරු ගලා එන්නේ කවර වේගයකින් ද? මෙය අප සියළු දෙනාගේම කුතුහලය දනවන ප්‍රශ්නයක්ම නොවන්නේ ද?




අන්තර්ජාලය සමග සම්බන්ධවී තමන්ට අවශ්‍ය වන කවර ක්ෂේත්‍රයක් හෝ විෂයයක් සම්බන්ධයෙන් හෝ වේවා තොරතුරු ලබා ගැනීම අද දවසේ සුලභ දෙයක් බවට පත්වෙමින් තිබෙයි.







"ඩයලප්" දුරකථන සබඳතාවක් තහවුරු වීමේදී දත්ත ගලන වේගය අපට පෙන්වා දෙන කවුළුවක් විවෘත වෙයි. එහෙත් මෙහි සඳහන් වන අගය ස්ථිතික එකකි. එනම් මුළු සබඳතා කාලය පුරාවටම එහි දැක්වෙන්නේ එකම අගයකි. එය නිවැරදි අගයක් නොවේ. මන්දයත් ජාලයේ දත්ත ගලන වේගය මොහොතින් මොහොත වෙනස් වන බැවිනි.

ලෝකයේ එක් එක් කලාපයන්හි දත්ත ගලන වේගය ඒ ඒ කලාපයන්හි භාවිතා කෙරෙන "සම්බන්ධක තාක්ෂණ විධික්‍රම" මත තීරණය වෙයි. දුරකථන පාදක ව්‍යූහයන් ශක්තිමත් කිරීම මගින් හා නව්‍ය තාක්ෂණයන් භාවිතාවෙන් යම් කලාපයකට, තම කලාපය තුළ ඉහළ දත්ත ගලන වේගයක් ස්ථාපනය කර ගැනීමට හැකිවෙයි. තොරතුරු විශාල ප්‍රමාණයක් කෙටි කාලයක් තුළදී අපගේ පරිගණකයට ලබාගත හැකිවෙතොත් එය අප ලබන ජයග්‍රහණයකි.







ඒ ඒ මොහොතේ අපට ජාලයෙන් ලැබෙන දත්ත ප්‍රමාණයේ වේගය මනින සේවාවක් ජාලය තුළින්ම දැන් නොමිලයේ ලබාගත හැකිය. අපට එය ලබා ගත හැක්කේ කෙසේ දැයි බලමු.

විස්තර සඳහා 38 පිටුව බලන්න.

රූ රටා නිර්මාණය - මෙත්තානන්ද විතාන

හෙළ අරුත් සැකසුම - ධර්මානන්ද විජේසිංහ

කොළඹ ඩී.ආර්. විජේවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.